මහෙස්ත්‍රාත් අධිකරණය
06 JUL 1987
අනුරාධපුරය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 21 දරන
# සංවර්ධන සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 අප්‍රේල් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 21 දරන සංවර්ධන සභා (සංශෝධන) පනත

එල්. ඩී.—ඕ. 14/86

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින.]

**1980 අංක 35 දරන සංවර්ධන සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1987 අංක 21 දරන සංවර්ධන සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ:— ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 17අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1980 අංක 35 දරන පනතේ 17අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ "සංවර්ධන සභාවල සහ සංවර්ධන සභාවල විධායක කමිටුවල මේ පනත යටතේ වූ" යන වචන වෙනුවට, "සංවර්ධන සභාවල සහ සංවර්ධන සභාවල විධායක කමිටුවල මේ පනත යටතේ වූ සහ, මහ නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත යටතේ වූ සහ, පිළිවෙලින් මහ නගර සභාවල සහ නගර සභාවල" යන වචන ආදේශ කිරීමෙන් සහ "ග්‍රාමෝදය මණ්ඩලයක් ද සෑම උප දිසාපති කොට්ඨාසයකම ප්‍රාදේශීය මණ්ඩලයක් ද පිහිටුවනු ලැබිය යුතුය." යන වචන වෙනුවට "ග්‍රාමෝදය මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) රජයේ නිලධරයකු වන හෝ රජයේ සංස්ථාවක නිලධරයකු වන ග්‍රාමෝදය මණ්ඩලයක කිසිදු සාමාජිකයකු, මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද හෝ ප්‍රදානය කිරීමට ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් විචාර බැලීමක දී හෝ තීරණය කිරීමක දී සහභාගි නොවිය යුතු අතර, එවැනි යම් ගිවිසුමක් අත්සන් කිරීම ද නොකළ යුතු ය.";

(3) එහි (3ඇ) උපවගන්තියේ "දිසා ලේකම්වරයකු විසින් මේ පනත යටතේ" යන වචන වෙනුවට, "මේ පනත යටතේ දිසා ලේකම්වරයකු විසින් හෝ මහ නගර සභා ආඥාපනත යටතේ හෝ නගර සභා ආඥාපනත යටතේ යම් මහ නගර සභාවක් හෝ නගර සභාවක් විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එහි (3ඇ) උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3ඇ) යම් තැනැත්තකු පහත දැක්වෙන නුසුදුසුකම් අතුරෙන් යම් නුසුදුසුකමකට යටත් වූවහොත්, ඔහු ග්‍රාමෝදය මණ්ඩලයක සාමාජිකයකු වශයෙන් ධූරය දැරීමට නුසුදුස්සකු කරනු ලැබිය යුතු ය:—

(අ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවූවහොත් ;

(ආ) ඔහු වයස අවුරුදු දහ අටට එළඹී නොසිටියහොත් ;

(ඇ) යම් නීතියක් යටතේ ඔහු සිහිවිකල් බවට නිශ්චය කරනු ලැබුවහොත් හෝ ප්‍රකාශ කරනු ලැබුවහොත් ;

(ඈ) පෙරාතුවම වූ වර්ෂ තුන ඇතුළත චරිත දූෂණ යට සම්බන්ධ යම් වරදකට ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ මාස තුනක හෝ වැඩි ගණනක බන්ධනාගාර ගත කරනු ලැබ ඇතිවිට හෝ මාස තුනක් හෝ වැඩි ගණනක බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටිනහොත් ;

(ඉ) ඔහු ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය බලකායේ සාමාජිකයකු වුවහොත් ;

(ඊ) ඔහු පොලිස් නිලධරයකු හෝ පොලිස් කටයුතු ක්‍රියාත්මක කරන රජයේ නිලධරයකු වුව හොත් ;

(උ) බංකොලොත් හෝ බුන්වත් යයි ප්‍රකාශ කරන ලදුව, ඔහු නිදහස් නොකළ බංකොලොත් කරුවකු හෝ බුන්වතකු වුවහොත් ; හෝ

(ඌ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව, පෙරාතුවම වූ අවුරුදු හත ඇතුළත ඔහු අල්ලසක් හෝ තුටු පඬුරක් පිළිගත් බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් හෝ විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් විසින් විනිශ්චය කරනු ලැබුව හොත්.";

(5) (4) වන, (5) වන, (5අ), (5ආ), (5ඇ) සහ (6) වන උප වගන්ති ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන් :—

(4) (අ) සෑම ග්‍රාමෝදය මණ්ඩලයකටම ඒ ග්‍රාමෝදය මණ්ඩලය පිහිටුවන ලද්දේ යම් ප්‍රදේශයක් ද ඒ ප්‍රදේශය ඇතුළත පහත දැක්වෙන කර්තව්‍ය සහ බලතල තිබිය යුතු ය :—

(i) සමාජ-ආර්ථික දත්ත එකතු කිරීම සහ ග්‍රාම සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම ;

(ii) ගම් මට්ටම් සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(iii) මහනගර සභා නගර සභා සහ ප්‍රාදේශීය සභා විසින් සකස් කරන ලදුව, ඒ මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා විසින් ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාමෝදය මණ්ඩල වෙත පවරන ලද යෝජනා ක්‍රම හෝ කර්මාන්ත ක්‍රියාත්මක කිරීම ;

(iv) පොදු පහසුකම් සහ වෙනත් සේවා සැපයීමට සැලසීම ;

(v) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වෙත ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීම,

(vi) පරිසරය ආරක්ෂා කිරීම සහ පාලනය කිරීම ;

(vii) රජයේ දෙපළ ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සහාය දීමට සැලසීම ;

(viii) සකසුරුවම්කම ධෛර්යමත් කිරීම සහ නාස්තිය නැති කිරීම ;

(ix) ඒ ප්‍රදේශය ඇතුළත වාසය කරන තැනැත්තන්ගේ ආගමික, සදාචාරාත්මක, සාමාජික, සංස්කෘතික සහ ආර්ථික අභිවෘද්ධිය සඳහා පහසුකම් සැලසීම ;

(x) එළදායිතාවය වැඩි කිරීම සහ රැකියා ඇති කිරීම සඳහා පියවර ගැනීම ;

(xi) යම් ග්‍රාමෝදය මණ්ඩලයක් පිහිටුවන ලද්දේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිහිටුවන ලද සංවර්ධන සභාවලට ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත වූ ප්‍රදේශ සඳහා පිහිටුවන ලද මහනගර සභා සහ නගර සභාවලට සහ ඒ ග්‍රාමෝදය මණ්ඩලය පිහිටුවන ලද්දේ යම් ප්‍රදේශයක් ඇතුළත ද ඒ ප්‍රදේශය සඳහා පිහිටුවන ලද ප්‍රාදේශීය සභාවලට ද එහි බලතල කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සම්බන්ධයෙන් නිර්දේශ සෑදීම.

(ආ) යම් ග්‍රාමෝදය මණ්ඩලයක් පිහිටුවන ලද්දේ යම් ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ යම් ස්ථානයකට ඉඩම්හට හෝ ගොඩනැගිල්ලකට, ඇතුල්වීම, ග්‍රාමෝදය මණ්ඩලය විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කරනු ලැබිය හැකි අතර, මේ උප වගන්තියේ (අ) ඡේදයේ (i) අනුඡේදයෙන් ග්‍රාමෝදය මණ්ඩලය වෙත පවරන ලද කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අවශ්‍ය යම් විමර්ශන සහ විභාග කරනු ලැබිය හැකි ය.

(ඇ) (අ) ඡේදය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා ඒ ඡේදය යටතේ ග්‍රාමෝදය මණ්ඩලයක් විසින් බලය සඳහා ලද වෙන යම් තැනැත්තකුට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරද කරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙසියයක දඩයකට යටත් විය යුතු ය.

(5) (අ) සෑම ග්‍රාමෝදය මණ්ඩලයක් විසින් ම, එහි පොදු මූල්‍ය කාර්ය සඳහා—

(i) ආණ්ඩුව විසින් දෙන ලද ප්‍රදාන හෝ වෙනත් මුදල් වෙන් කිරීම් ; සහ

(ii) පරිත්‍යාග හෝ වෙනත් ස්වේච්ඡා දායක මුදල් ආකාරයෙන් ලැබෙන මුදල් බැර කළ යුතු අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(ආ) ග්‍රාමෝදය මණ්ඩලය විසින් මේ පනත යටතේ එහි බලතල ක්‍රියාත්මක කිරීමෙහි සහ එහි කර්තව්‍ය ඉටු කිරීමෙහිලා දරනු ලැබිය හැකි සියලු වියදම් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(ඇ) සර්ම ග්‍රාමෝදය මණ්ඩලයකට අරදමුලේ විගණනය සහ ගිණුම් සම්බන්ධයෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ කරනු ලැබිය යුතු ය.

(6) මේ පනතින් හෝ වෙන යම් නීතියකින් යම් ග්‍රාමෝදය මණ්ඩලයක් වෙත පවරන ලද කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ සේවකයින් සේවයෙහි නියුක්ත කරවීමේ සහ ඒ නිලධරයන්ට සහ සේවකයන්ට පාරිශ්‍රමික ගෙවීමේ බලය සෑම ග්‍රාමෝදය මණ්ඩලයකටම තිබිය යුතුය ; තවද

(6) එහි (7) වන උපවගන්තියේ "ග්‍රාමෝදය මණ්ඩලය හෝ ප්‍රාදේශීය මණ්ඩලය" යන වචන දැක්වෙන කවර තැනක වුවද ඒ වචන වෙනුවට "ග්‍රාමෝදය මණ්ඩලය" වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"18 (1) මේ පනතින් හෝ ඒ යටතේ සංවර්ධන සභාවකට පනවනු ලැබ ඇති හෝ පවරනු ලැබ ඇති යම් කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඒ කාර්යය හෝ කර්තව්‍යය, මහ නගර සභා ආඥා පනතින්, නගර සභා ආඥාපනතින් හෝ ප්‍රාදේශීය සභා පනතින් හෝ ඒ යටතේ අවස්ථාවෝචිත පරිදි යම් මහ නගර සභා ප්‍රදේශයක්, නගර සභා ප්‍රදේශයක් හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් සඳහා පිහිටුවන ලද මහ නගර සභාවකට, නගර සභාවකට හෝ ප්‍රාදේශීය සභාවකට, මහ නගර සභා ආඥාපනතින්, නගර සභා ආඥාපනතින් ප්‍රාදේශීය සභා පනතින් හෝ වෙනත් ලිඛිත නීතියකින් පනවනු ලැබ හෝ පවරනු ලැබ ඇති අවස්ථාවක, ඒ සංවර්ධන සභාව පිහිටුවනු ලැබුවා වූ පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටියා වූ ඒ මහ නගර සභා ප්‍රදේශයේ හෝ නගර සභා ප්‍රදේශයේ හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පරිපාලන සීමාව තුළ ඉටුකිරීම නොකළ යුතු ය." ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඍ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඍඍ) යම් සංවර්ධන සභාවක් සංස්ථාපනය කරන ලද්දේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ද, ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත වූ යම් ප්‍රදේශයක් සඳහා පිහිටුවන ලද යම් මහ නගර සභාවකට, නගර සභාවකට හෝ ප්‍රාදේශීය සභාවකට වාර්ෂික සංවර්ධන සැලැස්මෙහි ඇතුළත් කරන ලද යම් යෝජනා ක්‍රමයක් හෝ කර්මාන්තයක් ක්‍රියාත්මක කිරීම පැවරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපලේඛනයේ (i) වන විෂය වෙනුවට, පහත දැක්වෙන විෂය ආදේශ කිරීමෙන් :—

"(i) හරක් කඩාවැදීම පාලනය කිරීම සහ පශු සංරක්ෂණය ඇතුළු ගොවිජන සේවා";

(ආ) ඒ උපලේඛනයේ (viii) වන විෂය වෙනුවට, පහත දැක්වෙන විෂය ආදේශ කිරීමෙන් :—

"(viii) වෙරළ සංරක්ෂණය ඇතුළු ධීවර කර්මාන්තය"; සහ

(ඇ) ඒ උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන අලුත් විෂය එක් කිරීමෙන් :—

"(xvi) පරිසරය".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නැම වර්ෂයකම දෙසැම්බර් 15 දට ප්‍රථම දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.